12 වන පිටෙන්

තෙක් තමාගේ හිත මහත් අසහනයකින් පෙළෙන්නේ යැයි ඔහුට සිතිණ. ඔහු ඇඳේ දෙපසට හැරුණේය. විටෙක වාඩි වුනේය. දරුවන් සමඟ කතා කරද්දී කඳවුරේ මහත්තය දකුණු පළාතේ කෙනෙක් බව එක දරුවෙක් කියනු ඔහුට ඇසිණ. දකුණු පළා-තේ උදව්ය පැණි වලලු කෑමට ඉතා ආශා බව කාලයක් මාතර පැත්තේ ඉස්කෝලෙක වැඩ කළ තෙන්නකෝන් ඉස්කෝල මහත්තයා කී බව පෙදරේරුවා ට මතක් විය. "හරි උදෙන්ම පැණි වලලු ටිකකුත් හදාගෙන ගෙයි පිටි පැත්තෙ තියෙන ආනමාලු කැන ඉදෝගෙන මහත්තය බලන්න යනව'' පෙදරේරුවාගේ හිතට යම් සහනයක් දැනිණ. ඉන්පසු පෙදරේරුවා ට නින්ද ගියේය.

නිවස පිටුපස ඇති ආනමාලු කෙසෙල් කැන කපාගත් පෙදරේරුවා එය දුම් ගසා ඉදවීමට වළක් කපන්නට විය. ''ආ පොඩි අයියා!කෙහෙල් වල දාන්න හදන්නේ ලොකු නෑ ගමනක් යන්න වගේ'' .කුඹුරු වැඩ කරන විමලෙ මල්ලි දුරතියාම කෑ ගසා ගෙන ආවේය. " ආ මේක කපපන් මං කැප්පෙටියා කොළ ටිකකුයි පරඬැල් ටිකකුයි අරගෙන එන්නම්'' පෙදරේරුවා කීවේය. ''පොඩි අයියේ කෝ පුතා නැද්ද? නැත්තං එයාගෙ මේ වැඩ කරන්නෙ "විමලෙ ඇසීය.'' කුරුණෑගල පැත්තෙ බිල්ඩිමට වැඩ හදිසි වෙලා මිනිහා එතන නතර වෙලා වැඩ''. පෙදරේරුවා කීවේය. "ඒක හොඳයි මේ පැතිවල ඉන්න පුළුවන්ද, හැමදාම රෑට යමපල්ලෝ එනවනෙ.'' විමලේ කීය. දෙදෙනාම එකතුව කෙසෙල් කැන වළ දමා වලට දුම් පුරවා වැසීය. "හෙට වෙනකොට හොඳට ඉදිලා තියෙයි'' පෙදරේරුවා කීවේය මේ අතර එජාප දේශපාලනඥයින් කිහිප දෙනෙකු එවකට ආරක්ෂක අමාත්‍යවරයාව සිටි රන්ජන් විජයරත්න මහතා හමුවට ගියේය.



රංජන් විජේරත්න

"සර් දැන් මාතලේට අලුතින් දාලා ඉන්නවා ගෝඨාභය කියල හමුදා නිලධාරි-යක් ".එක් දේශපාලකයෙක් කීය. "ඔව් ඉතිං''. විජයරත්න මහතා එය ගණනකට නොගත්තාක්මෙන් කීවේය. " සර් එයා විප-ක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් ඉන්නෙ මහින්ද රාජපක්ෂ කියලා. එයාගේ ඔය ජේවීපී කාරයෝ බේරගන්න දඟලන්නේ, එයාගේ මල්ලි තමයි ගෝඨාභය'' මාතලේ එජාප දේශපාලනඥයා කීවේය. ''ඔව් එයාගේ මල්ලි තමයි, ඉතිං කියන්න තියෙන දේ කෙළින් කියනවා අයිසෙ මෙතන තෙපර බාන්නෙ නැතුව ".රන්ජන් විජයරත්න ඇමතිවරයා ගුගුළේය. දේශපාලනඥයින්ට කියන්නට ආ දෙයත් අමතක විය. එක් දේශපාලනඥයෙක් මුහුණට ආ දහඩිය ද පිසදමමින් "ගෝඨා-භය ජේවීපී කාරයින්ට සපෝට් කරනව'' යැයි කීය. අයියගෙම මල්ලිනෙ සර් "අනිත් දේශපාලඥයා කීවේය. "හරි ඒක මං බලාග න්නම්, තමුසෙල හමුදාවේ වැඩවලට ඇඟිලි ගහන්ඩ ඕන නෑ , දැන් තමුසෙල යනවා''. ඇමතිවරයා කීවේය.

රංජන් විජේරත්න ඇමතිවරයාගෙන් බ්‍රිගේඩියර් විමලරත්නට දුර ඇමතුමක් ලැබිණ. " බ්‍රිගේඩියර් ඔය ගෝඨාභය ඉන්නේ ඔයා යටතෙනෙ, මිනිහා කොහොම කෙනෙක්ද?'' ගෝඨාභය කියන්නේ මගේ ළඟ ඉන්න ඉතාමත් දක්ෂ නිලධාරියෙක්, ඒ විතරක් නෙමෙයි එයාට භාරදුන්න වැඩක් අකුරටම ඉෂ්ඨ කරනව, බොහොම අවංක නිලධාරියෙක්. බ්‍රිගේඩියර් පිළිතුරු දුන්නේය. "හොඳයි ආයේ ඕන වුණොත් මම කතා කරන්නම්'' අමාත්‍යවරයා කීවේය.

"මැණිකෙගෙ අත්ගුණය නං කියල වැඩක් නෑ පැණිවලලු ටිකේ සුවඳ එනකොට නොකා ඉන්න බැරිවෙනව ,ඒ මහත්තයා ගොඩක් සතුටු වෙයි''. පෙදරේරුවා කීය. තවන ලද කෙසෙල් කොළ මත පැණි වළලු 5 බැගින් තබා ඒවා කෙසෙල් කොළ වලින් ඔතා සකස් කළ පෙදරේරුවා කෙසෙල් කැන ඇවරි වලට කපා කාඩ් බෝඩ් පෙට්ටියට දැමීය. ඒ මත පැණිවලලු පාර්සල තබා පෙට්ටිය ලනු වලින් හොඳට ගැට ගැසීය.

බස් රථයෙන් කඳවුරකට ගිය පෙදරේරුවා ට සෙබළු කියා සිටියේ "දැන්නම් කොහොමවත් මහත්තයා හම්බවෙන්න බෑ, දැන් ආරක්ෂක ඇමතිතුමා ඇවිල්ලා ඉන්නේ. මෙතන ඉන්නත් එපා, අර කඩේ ගාවට ගිහිල්ලා ඇමතිතුමා යනකං ඉඳලා එන්න'' පෙදරේරුවා කඩයට ගොස් කහට කෝප්පයක් බී ගේට්ටුව දෙස බලා සිටියේ ඇමතිතුමා යන තෙක් ය.

කඳවුරට ආ ආරක්ෂක ඇමතිවරයා ගෝඨාභය ඒ ප්‍රදේශයේ තත්ත්වය සෑහෙන දුරට පාලනය කර තිබීම ගැන සතුටට පත්විය. "ගෝඨාභය තමුන්ට මේ පැත්තෙ මන්ත්‍රීවරුන්ගෙන් කරදර බලපෑම් තියනවනම් කෙලින්ම මට කියන්න''. ගෝඨා-භයගේ අසුනේ වාඩිවී සිටි අමාත්‍යවරයා දකුණතින් බෝල්පොයින්ට් පෑන හොලවන ගමන් ගෝඨාභයට කිව්වේය. ''ඕකේ සර්'' ගෝඨාභය පිළිවදන් දුන්නේය.

ආරක්ෂක රථ පෙළක් පෙරටුකොටගෙන ඇමතිවරයා කඳවුරෙන් පිටත් වනු පෙදරේරුවා දුටුවේය. ඔහු තවත් ටික වේලාවක් හිටියේ යළිත් ඇමතිවරයා යළි හැරී ඒදෝ යයි යන බියෙනි. කඳවුරු ගේට්ටුවෙන් ගෝඨාභයට පණිවිඩයක් යැවිණ. ගෙනැවිත් ඇති දෑ සහ ශරීරය පරීක්ෂාවෙන් අනතුරුව ඔහුට ගෝඨාභය හමුවට අවසර ලැබිණි.

"මොනාද ඔය'' ගෝඨාභය තම අසුන ළඟ හිටගෙන ඇසුවේය. "සර් මං මේ සර්ට පොඩි තෑග්ගක් ගෙනාව'' පෙදරේරුවා ගොත ගසමින් කිව්වේය. ''මට මේවා නිතර නිතර කියන්න බෑ, අපි කරන්නේ රස්සාවක්, අපිට මේවට පඩි ගෙවනව, මට ඔගොල්ලොන්ගේ පඬුරු පාක්කුඩම් ඕන නෑ. දැන් කරුණාකරලා ඕකත් අරන් යන්න'' ගෝඨාභය ඉතා සැරෙන් කියා පුටුවේ වාඩි විය. බියට පත්වූ පෙදරේරුවාගේ දෑස කඳුළින් තෙත් විය, ''අපේ උන්දෑ බුද්ධ පූජාව හදනවා වගේ බොහෝම සර්ධාවෙන් මේවා හැදුවේ සර්ට, උන්දැගෙ හිත නරක් වෙයි සර්'' පෙදරේරුවා බයාදු ලෙස කීවේය. ගෝඨාභයගේ සිත එක්වරම මැදමුලන ගෙදරට ගියේය. තමාගේ අම්මා ඉතා ශ්‍රද්ධාවෙන් බුද්ධ පූජාව පිළියෙල කරන අයුරුත් ඔහුගේ තාත්තා හා අයියා පූජාව පන්සලට ගෙන යන අයුරුත් ඔහුගේ මනසේ ඇඳෙන්නට විය. ඔහු තත්පර කිහිපයක් දෙනෙත් පියා ගත්තේය.

"හරි මොනවද මේ ගෙනල්ලා තියෙන්නේ'' ගෝඨාභය මෘදු ස්වරයෙන් කතා කළේය. පෙදරේරුවාගේ මුහුණට සිනා රැල්ලක් ආවේය , "සර් මේ පැණි වළලු යි ආනමාලු කෙසෙලුයි ,මං අහලා තියෙනවා සර් දකුණු පළාතේ උදව්ය පැණි වළලුවලට ගොඩක් ආසයි කියලා''. ''මං දකුණු පළාත කෙනෙක් කියලා කොහොමද දන්නේ" "ගෝඨාභයගේ පැනයට පෙදරේරුවාගෙ න් පිළිතුරක් නොවීය. පෙදරේරුවාගෙ සිත සතුටින් පිරී තිබුණි. "හා මෙතනින් තියන්න එහෙනම්'' කියා ගෝඨාභය තම වීදුරුව වසා තිබූ පීරිසිය ගෙන මේසය මතින් තැබුවේය. පෙදරේරුවා කෙසෙල් කොළයේ ඔතා ඇති කුඩා පැණිවලලු පාර්සලයක් පීරිසිය මතක තබා කෙසෙල් ඇවරියක් මේසය මත තැබීය. පාර්සලය ලිහා ඉන් එකක් අතටගත් ගෝඨාභය "අප්පා සුවඳ , සුවඳ වගේම තමයි රසත් බොහොම රසයි තමුන්ගේ නෝනට ගිහිල්ලා කියන්න, කියමින් කෙසෙල්ගෙඩි දෙකක් ද කඩා මේසය මතින් තැබුවේය. හරි දැන් ඔය ඉතිරි ටික මේ සොල්දාදු මහත්තයත් එක්ක ගිහිල්ලා ඔයාගේ දරුවන්ට දීලා විනාඩි 10න් එන්න.

පෙදරේරුවා විනාඩි දහයක් යන්නට මත්තෙන් යළි පැමිණියේ ය. ''මං මේකයි කියන්නේ කඳවුරට පිටින් යන එන අය ගැන සෝදිසියෙන් එළියෙ ඉන්නවා කට්ටියක්, ඒගොල්ලො හිතන්නෙ කවුරු හරි මේ කඳවුරට එන්නෙ ඔත්තු දෙන්න කියලා ,අන්තිමට එයාල අල්ලගෙන ගිහිල්ලා වෙඩි තියලා කපලා කොටලා මරල දාල මිනිය වළ දාන්න ගෙනියන්න දෙන්නෙත් දනින් පහලට එල්ලගෙන, ඒකයි මම කියන්නේ මීට පස්සේ මෙහාට එන්න එපා, දෙන්නෙක් විතරක් සතියකට සැරයක් ඇවිල්ලා ළමයින්ගෙ දුක.සැප බලලා යන්න, ගෙනාපු සංග්‍රහයට බොහොම ස්තූතියි, මම දන්නවා ගම්වල ඉන්නේ හරි හිත හොඳ අය බව, හොඳයි හොඳයි දැන් පරිස්සමට යන්න.'' හිස මත තබාගෙන සිටි මහ ගලක් බිමින් තැබුවාක් මෙන් සැහැල්ලුවක් පෙදරේරු වට දැනිණි.

1989 නොවැම්බර් මස දහතුන් වැනිදා විජේවීර අත්අඩංගුවට පත්වීමත්, ඒ සමගම ගමනායක ඇතුළු ප්‍රමුඛ පෙළේ නායකයින් ද අත්අඩංගුවට පත්ව ඝාතනය වීමත් හේතුවෙන් ජවිපෙ,ප්‍රා ,කළු බළල්ලු ආදී සංවිධානද හීෂණයද නිමාවිය.

කඳවුරේ සිටි දරුවන් ලේඛනයක අත්සන් කොට දෙමවුපියන්ට භාර දුන් අතර බිම පෙරලි පෙරලි දෙපා වැඳ දරුවෝ පිටත්ව ගියහ .දෙමාපියෝ කාමරයෙන් එළියට යන තෙක්ම ගෝඨාභය දෙස බලමින් තම කෘතඥතාවය පළ කළහ.

එදා සිටි දෙමව්පියන්ගෙන් කිහිප දෙනෙක් අද ජීවතුන් අතර නැත. ඒ ළමයින් අද දෙමාපියෝ ය. එදා පෙදරේරුවා ට අද වයස අවුරුදු 80 ක් පමණ වේ. ඔහු නිවසේ නිදුක් නිරෝගීව කල්ගත කරයි. පෙදරේරුවා හා ඔහුගේ පුතු මට හමුවූයේ මාගේ කුණ්ඩසාලේ නිවස තැනීමට පැමිණි මොහොතේය. එම පිය පුතු දෙපලට ස්තූති-වන්ත වෙමි. විටින් විට මා සමග පිළිසඳරේ යෙදුන අභාවප්‍රාප්ත බ්‍රිගේඩියර් විජය විමලරත්න මහතාද ඔහුගේ සොහොයුරා වන මාගේ කලණ මිතුරු අභාවප්‍රාප්ත රන්ජන් විමලරත්න මහතාද සිහිපත් කරමි .

8 වන පිටෙන්

නිර්මාණය වුණ ගීතය නාටකයකි. එහි ද යම් වෙනසක් දැකිය හැකි විය. ''හිනාව රඳවමු ජීවිතයේ'' තවත් නර්තනයකි. ''ගැමි වරුණ'' අංගයෙන් ජන කවි වර්ග ගායනා විය. මෙහි දී ද විශේෂ ගායනා කුසලතාවයන් දැකගත හැකි විය. ''සිහින අහසේ'' ගීයට කළ නර්තනය අවසන් අංගයයි. ''පැහැසර'' ප්‍රසංගය පුරාවට රිදී රේඛාවක් සේ විහිද ගියේ ප්‍රසංගය ඉදිරිපත් කළ දියණියන් දෙදෙනාගේ කථනය, රඟපෑ ම සහ හැඟුම්බරව ඉදිරිපත් කිරීමයි.

ජාත්‍යන්තර ළමා දිනය වෙනුවෙන් විනීතා විජේරත්න මහත්මියගේ මුලිකත්වයෙන් මිහිඳු ළමා පදනම ඉදිරිපත් කළ පොත් එළිදැක්ම ළමා වේදිකාව වෙනම ම මානයකට යොමු කරවුවකි. ''The Grass-hoppers and the Ants'' නමින් හසළි පෙරේරා දියණිය ලියූ පොත එළිදැක්වීම වඩාත් වැදගත් වූයේ ලේඛන කලාවේ නියැලෙන දරුවන් දිරිමත් කරනා අවස්ථාවක් වූ නිසයි. තියාරා බාලමන්ගේ දැරිය පොතේ කංචුකය මතු නොව ඇතුල් පිටු පවා සිය ආකර්ශණීය ළමා සිතුවම්වලින් සරසා තිබුණා ය. සිත්තර දරුවන්ට අවස්ථාව ලබා දීම ද ඉහළින් ම අගය කළ යුතු වේ.

කීස්බරෝ හි ධම්මසරණ විහාරස්ථා-නාධිපති පූජ්‍ය ගරු නාඹටුන්නේ විජිත ස්වාමීන් වහන්සේ ප්‍රධාන ආරාධිතයා ලෙසින් කළ අනුශාසනාව ද ඉතා වැදගත් විය. උත්සවාරම්භයේ දැරියක විසින් ගැයූ මිහිඳු ළමා පදනමේ තේමා ගීයෙන් පසුව ළමා අංග ඉදිරිපත් විය. ''ගණපති පූජාව'' නර්තන අංගයක්, ''තණකොළ පෙත්තාට පාඩමක්'' නාට්‍යයත් අනෙකුත් ළමා අංග ලෙස වේදිකාගත විය.

දරුවන් වෙත අපගේ හැදියාවන්, කලාවන්, හැකියාවන් දායාද කොට වේදිකාප්‍රාප්ත කරවීම අප කරනා සරු ආයෝජනයකි. ඔවුන් අනාගතයේ දී මේ දේවල් ඉදිරියටත් කරනවාද, අත්හරිනවාද යන්න වෙන ම කාරණයකි. අත් හල ද ඔවුනට ඉතිරිවන ගුණාංග රැසක් වෙයි. විනය, සාමූහිකත්වය, ඉවසීම, බෙදා හදා ගැනීම, රස වින්දනය ඒ අතරින් කීපයක් පමණි.

මේ වෙනුවෙන් කැපවෙන ගුරුවර ගුරුවරියන් දෙමව්පියන් ඇතුළු සියළු වැඩිහිටියන්ට අපගේ ගෞරවය හිමි වේ. එලෙස කැප වී ළමුන් වෙනුවෙන් නිර්මාණය වන වේදිකාවේ වැඩි ඉඩකඩක්, ප්‍රමුඛත්වයක් දරු දැරියන්ට ම ලබා දීමට කාරුණික වන්නේ නම් මැනැවි. ප්‍රසංගවලදී තමන් සහ තමන්ගේ ඉංග්‍රීසි වාග් චාතුර්යය පෙන්වීමට උත්සාහ කළ විදුහල්පතිවරයා සහ පියා අපට නම් විහිළුවක් ම විය. අප මේ උත්සව සඳහා සහභාගී වන්නේ දරුවන්ගේ හපන්කම් බැලීමටයි. කෙතරම් දීර්ඝ ප්‍රසංගයක් වුව ද කොතෙකුත් අඩුපාඩුකම් මධ්‍යයේ වුව ද අපට ළමා ප්‍රංදගය අවසානය තෙක් රසවිඳිය හැකියි. එහෙත් වැඩිහිටියන්ගේ අමනොඥ ක්‍රියාකාරකම් සඳහා කාලය වැය කිරීම කාර්ය බහුල ප්‍රේක්ෂකයින්ට නම් අපහසු කාරණයකි. මේ පිළිබඳවන එකී වැඩිහිටියන්ගේ අවධානය යොමු වන්නේ නම් මැනැවි. ස්තූතියි

